යම් කිසි ආබාධයක් සහිත පුද්ගලයෙකු සම්බන්ධ වන පුවතක් වාර්තා කිරීමේදී, ඔවුන්ව හැඳින්වීමට යොදාගත යුතු යෙදුම් සම්බන්ධයෙන් ලෝකයේ කතිකාවත් ඇති වී තිබේ. එයින් එකක් වන්නේ, අදාළ ආබාධය පුවතට අදාළ වේ නම්, එම පුද්ගලයා "ආබාධිත පුද්ගලයෙකු (A disabled person)" ලෙසින් නොහඳුන්වා ඒ වෙනුවට එම පුද්ගලයා "ආබාධ සහිත පුද්ගලයෙකු (A person with a disability)" ලෙසින් හැඳින්වීමයි. මේ ඔස්සේ බලාපොරොත්තු වන්නේ ආබාධ සහිතව ජීවත් වන්නවුන්ව කිසිම ලෙසකින් සමාජය තුළ කොන් වීම හෝ, ඔවුන්ට වෙනස් ලෙස සැලකීම වැළැක්වීමයි. මෙය හැඳින්වෙන්නේ Person-first language නැතිනම් 'පුද්ගලයා පළමු වන භාෂාව' ලෙසයි. එනම් මෙහි අදහස වන්නේ ඒ පුද්ගලයා පළමුව පැමිණෙන බවත්, ඔහුගේ ආබාධ දෙවන තැන ගන්නා බවත් වේ.

ඒ අනුව,

"මාළු ගන්න ගිය ආබාධිත යුද නිලධාරියාට පහර දීලා" නැතිනම් "උපන් දා සිට ආබාධිත ලක්ෂාණිට පිහිට වෙන්න" වැනි සිරස්තල තුළ, "ආබාධ සහිත" වැනි පුද්ගල ප්‍රථම භාෂාවකට අනුකූල යෙදුම් භාවිතා කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

ආබාධ සහිත වූවන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී වඩාත් යෝග්‍ය වන යෙදුම් සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

(ජනවාරි 16, 2022 ඉරිදා දිවයින සහ ජනවාරි 18, 2022 ලංකාදීප)

මූලාශ්‍ර:
https://adata.org/factsheet/ADANN-writing
https://ncdj.org/style-guide/
http://www.disability.wa.gov.au/.../words_that_work_media...
https://pwd.org.au/.../2019/08/PWDA_LanguageGuide_A5_WEB.pdf